**1.** **තනතුර - විදුලි කාර්මික/ජනක යන්ත්‍ර ක්‍රියාකරු**

**2.** **වයස** - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

**අ.** **බාහිර අයදුම්කරුවන්**

i. විදුලි කාර්මික ජනක යන්ත්‍ර ක්‍රියාකරු තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතා (NVQ) හතර (04) වැනි මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**ආ.** **අභ්‍යන්තර අයදුම්කරුවන්(පහත සුදුසුකම් වලින් 2 න් එකක් සපුරා තිබිය යුතුයි)**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

ii. විදුලි කාර්මික ක්ෂේත්‍රයෙහි වසර පහ (05) ක පළපුරුද්ද සහ කාර්මික විද්‍යාලයකින්/ වෘත්තීය පුහුණු ආයතනයකින් අදාළ තනතුරෙහි කාර්යභාරයට අනුකූල වන ජාතික වෘත්තීය කුසලතා (NVQ) දෙවැනි (02) මට්ටමට නොඅඩු මට්ටමක වෘත්තීය පරීක්ෂණයකින් (Trade Test) සමත් වන ප්‍රාථමික අර්ධ ශිල්පීය (PL 2 ) ප්‍රාථමික ශිල්පීය නොවන (PL 1) සේවා ගණයක සේවකයින්

**ඇ.** **වෙනත්**

i. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරිම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ය චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **වැටුප් තලය**

ස්ථිර වැටුප් පරිමාණය - PL 3 - 2025

මූලික වැටුප - රු. 40,834.00 (2026), රු. 43,280.00 (2027)

ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.

වාර්ෂික වැටුප - 40,834.00 + 17800.00 x12 = රු. 703,608.00 (2026)

43,280.00 + 17800.00 x12 = රු. 732,960.00 (2027)

**5.** **රාජකාරී ස්වභාවය**

i. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ගොඩනැගිලි වල සියලුම විද්‍යුත් පරිපථයන්හි අලුත්වැඩියාවන් හා නඩත්තු කටයුතු සිදුකිරීම.

ii. නිවැරදි නිර්ණායකයන්ට අනුව නව විදුලි උපාංග හා පරිපථ ස්ථාපනය කිරීම

iii. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්ට අයත් හා බාහිර ආයතන මගින් ලබා ගන්නා විදුලි ජනක යන්ත්‍ර ආරක්ෂාරීව ක්‍රියා කරවීම හා නඩත්තුව.

iv. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි ඇති ආරක්ෂක විදුලි පහන් හා විදුලි වැට හදිසි බිඳ වැටීමකට ලක් නොවන අයුරින් පවත්වා ගෙන යාම හා ඒ සඳහා ගත හැකි විකල්ප ක්‍රියා මාර්ග පෙර පුහුණු වීම් කර සූදානමින් සිටීම.

v. කාර්යාංශයේ හා ඒ යටතේ ක්‍රියාත්මක වන ආයතනයන්හි හදිසි විදුලිය බිඳ වැටීමක් සිදු වුවහොත් ක්ෂණිකව එය හඳුනා ගැනීම හා ඒ සඳහා ක්‍රියාත්මක වීම.

vi. ජාතික විදුලි බල පද්ධතිය මගින් ලබාදෙන විදුලියෙහි බිඳ වැටීමක් සිදු වුවහොත් ආරක්ෂිත වැට / පිරික්සුම් ලාම්පු ක්ෂණිකව ජනක යන්ත්‍ර මගින් පණ ගැන්වීම සඳහා ක්‍රියා කිරීම.

vii. අනවසර අයුරින් විදුලිය පාවිච්චි කිරීමට හැකි සියලුම මංපෙත් අසුරාලීමට අවැසි ක්‍රියා මාර්ග ගත යුතුය.

viii. ජාතික අවශ්‍යතාවයක් වන විදුලිය අරපිරිමැස්ම පිළිබඳව මනා අවබෝධයකින් ක්‍රියා කළ යුතුය.